**මාවනැල්ල අධ්‍යාපන කලාපය**

**Zonal Education Office Mawanella**

| | |
|---|---|
| **තෙවන වාර පරික්ෂණය 2019** | **6 ශ්‍රේණිය** |
| **Third Term Test 2019** | **Grade - 6** |
| **ගණිතය - I , II** | **කාලය පැය 2 මි.30** |

## I – කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.**

01). රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ වර්ගඵලය 5 $cm^2$ ඒ අනුව සමචතුරස්‍රයේ වර්ගඵලය නිමානය කරන්න.



02). තරිඳු සංඛ්‍යාවක් ලියයි. එය 40 ට වඩා අඩු සංඛ්‍යාවකි. එය ත්‍රිකෝණ සංඛ්‍යාවකි. එය සමචතුරස්‍ර සංඛ්‍යාවක් ද වේ. තරිඳු ලියූ සංඛ්‍යාව කුමක් ද?

03). පහත දැක්වෙන සංඛ්‍යා අතරින් 3 ඉලක්කම මඟින් 30 නිරූපණය වන සංඛ්‍යාව යටින් ඉරක් අඳින්න.

i). 7320 ii). 3589 iii). 1435

04). 256 යන සංඛ්‍යාව 4 හි බලයක් ලෙස ලියා එම බලයේ පාදය සහ දර්ශකය වෙන වෙනම ලියන්න.

05). සෙනසුරාදා පෙ.ව. 11. 00 ට ආරම්භ වන ගණිත පන්තිය එදින ප.ව. 1 . 30 ට අවසන් වේ. පන්තිය පැවැත්වූ කාලය කොපමණද ?

06). පහත දැක්වෙන භාග දෙක එකතු කර පිළිතුර සරලම ආකාරයෙන් ලියන්න.

$$\frac{1}{8} + \frac{3}{8}$$

07). 4 kg 25 kg ග්‍රෑම් වලින් පමණක් ලියන්න.

08). පහත දැක්වෙන ඔරලෝසුවේ පැය කටුව හා මිනිත්තු කටුව අතර සලකුණු කර ඇති කෝණය කුමන වර්ගයට අයත්දැයි ලියන්න.




09).




ඉහත දැක්වෙන සංඛ්‍යා රේඛාව මත අමල්ගේ පියාගේ වයසත් අමල්ගේ වයසත් නිරූපණය කර ඇත. ඒ අනුව පහත හිස්තැන්වලට ගැලපෙන අක්ෂර ලියන්න.

අමල්ගේ වයස :- අවු .............................. අමල්ගේ පියාගේ වයස :- අවු ......................

10). සෘජුකෝණාස්‍රයක වර්ගඵලය 12 $cm^2$ එහි දිග හා පළල පූර්ණ සංඛ්‍යාත්මක අගයන් වේ නම්, දිග හා පළලට ගත හැකි අගයන් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | දිග (cm) | පළල (cm) |
|---|---|---|
| i | | |
| ii | | |

11). මුහුණත් සියල්ල සමාන වන ඝන වස්තු 2 ක නම් ලියන්න.

12). පහත දැක්වෙන අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියන්න.

2 : 3

13). සෘජුකෝණාස්‍රයට හා සමචතුරස්‍රයට පොදු වූ ලක්ෂණයක් හා පොදු නොවූ ලක්ෂණයක් ලියන්න.

14). කාසියක් 30 වරක් ඉහළ දැමූ විට ලැබුණු ප්‍රතිඵල ඇතුළත් අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ. එය සම්පූර්ණ කරන්න.

| ලද ප්‍රතිඵලය | ප්‍රගණන ලකුණු | වාර ගණන |
|---|---|---|
| අගය | 卌 卌 卌 \|\| | ............................. |
| සිරස | ..................................... | 13 |

15).



ප්‍රථමක සංඛ්‍යා      4 ගුණාකාර

පහත දැක්වෙන සංඛ්‍යා අතරින් ඉහත කාණ්ඩ දෙකට ගැළපෙන සංඛ්‍යා කාණ්ඩ තුළ ලියන්න.

4, 5, 6, 7, 8, 9

16). පහත දැක්වෙන රූප සටහන අනුව හිස්තැන් පුරවන්න.

i) මල් ගසට ................................ දිශාවෙන් ළිඳ පිහිටා ඇත.

ii) පොල් ගසට උතුරු දිශාවෙන් ............................ පිහිටා ඇත.




17). $x = 10$ විට පහත දී ඇති වීජීය ප්‍රකාශනයෙහි අගය සොයන්න.

$7 + x$

18). ගුණ කරන්න.

$$\begin{array}{r} 234 \\ +\ 201 \\ \hline \\ \hline \hline \end{array}$$

19). 2147 km දිග කිලෝමීටර සහ මීටර වලින් දක්වන්න.

20). කඩදාසියකින් 0.3 ක් මීයෙක් විසින් කා දමා ඇත. ඉතිරි කොටස භාගයක් ලෙස ලියන්න.

## II -පත්‍රය

**ප්‍රශ්න 6 කට පමණක් පිළිතුරු සපයන්න.**

01). **සැඟවුණු සංඛ්‍යා 5 සොයා ගැනීමට ප්‍රහේලිකාව**

පහත දැක්වෙන හිස් කොටු තුළ සංඛ්‍යා 5 ක් සැඟ වී ඇත. එම සංඛ්‍යා පහත දැක්වේ. දී ඇති හෝඩුවාවන් භාවිතයෙන් එම සංඛ්‍යා 5 සොයා ගත හැකිය. සැඟ වී ඇති සංඛ්‍යා 1 -20 අතර වේ.

4, 1, 19, 16, 8

| අංකය | සැඟවුණු සංඛ්‍යාව | හෝඩුවාව |
|---|---|---|
| 1 | | 1 ත් 20 අතර ඇති විශාලතම ප්‍රථමක සංඛ්‍යාව |
| 2 | | කුඩාම සංයුත සංඛ්‍යාව |
| 3 | | 10 වැඩි සමචතුරස්‍ර සංඛ්‍යාවකි |
| 4 | | 5 ත් 10 ත් අතර ඉරට්ට සංඛ්‍යාවකි. |
| 5 | | ත්‍රිකෝණ සංඛ්‍යාවකි. |

02). i. සුළු කරන්න. 54 . 25 - 5 . 13

ii. 0.3 cm ඝනකමින් යුතු වීදුරු කැට 10 ක් තිරස්ව එක මත එක තබා ඇත. එවිට මුළු උස සොයන්න.

iii. $\frac{9}{30}$ දී ඇති භාගය සරලම ආකාරයට ලියා දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

iv. සංඛ්‍යා රේඛාවක් ඇඳ A , B සංඛ්‍යා එම රේඛාව මත නිරූපණය කරන්න.

A = -2 B = + 3

03). a) i. සෘජුකෝණාස්‍රයක දිග 1m කි. එහි පළල 80 cm කි. දිග හා පළල අතර අනුපාතය ලියන්න.

ii. පංතියක ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් අතර සරලම අනුපාතය 8 : 7 වේ. ගැහැණු ළමුන් ගණන 24 නම් පිරිමි ළමුන් ගණන කීයද?

b) i. 3cm දිග, 2 cm පළල සෘජුකෝණාස්‍රයක් ඇඳ එහි වර්ගඵලය සොයන්න.

ii. වර්ගඵලය 12 $cm^2$ වූ එකිනෙකට වෙනස් සෘජුකෝණාස්‍ර 2 ක් අඳින්න.

iii. පහත දැක්වෙන 1cm x 1 cm වූ කොටු දැලකි.



අඳුරු කර ඇති ත්‍රිකෝණයේ වර්ඵලය සොයන්න.

04).

a) i. සුළු කරන්න. 2m + 3m 85 cm

ii. 6 m කඹයකින් 4m 20 cm කොටසක් කැපූ විට ඉතිරි කොටසේ දිග සොයන්න.

iii. 8 m දිග කම්බියක් සම්පූර්ණයෙන් භාවිතා කර දිග 2 m 50 cm වූ සෘජුකෝණාස්‍රයක් සාදයි. එහි පළල සොයන්න.



b) i. 2050 ml - ලීටර සහ මිලිලීටර වලින් ප්‍රකාශ කරන්න.

ii. මෙම භාජනයේ ඇති ද්‍රව පරිමාව 400 ml නම් භාජනයේ ධාරිතාවය සොයන්න.

---

05).



a) i. පාද 3 කින් යුත් සංවෘත බහු අස්‍රය හඳුන්වන නම කුමක් ද?

ii. සමාන්තරාස්‍රයක් ඇඳ එහි ඇති මහා කෝණයක් නම් කරන්න.

b) i. පහත දැක්වෙන පතරොම භාවිතා කර සෑදිය හැකි ඝන වස්තුව ඇඳ එහි නම ලියන්න.

ii. එහි ඇති ශීර්ෂ සංඛ්‍යාවේ සහ දාර සංඛ්‍යාවේ එකතුව සොයන්න.

---

06). i. සුළු කරන්න.

$\frac{1}{4} + \frac{3}{8}$

ii. සුළු කරන්න. $\frac{2}{10} - \frac{1}{5}$

iii. හරය සමචතුරස්‍ර සංඛ්‍යාවක් වනසේ $\frac{2}{3}$ සඳහා තුල්‍ය භාගයක් ලියන්න.

iv. පහත දැක්වෙන භාග සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.

$\frac{1}{8}$ , $\frac{1}{7}$ , $\frac{1}{3}$ , $\frac{1}{10}$ , $\frac{1}{4}$

v. කේක් ගෙඩියක් සමාන කොටස් 8 කට බෙදන ලදී. කමලා එයින් කොටස් 3 ක් අනුභව කරන ලදී. ඉතිරි කේක් ප්‍රමාණය භාගයක් ලෙස ලියන්න.

---

07). a) ළමුන් 50 දෙනෙකුගෙන් ලබා ගත් තොරතුරු පහත වගුවේ නිරූපණය වේ. එහි හිස්තැන් පුරවන්න.

| කැමති ක්‍රීඩාව | ප්‍රගණන ලකුණ | ළමුන් ගණන |
|---|---|---|
| ක්‍රිකට් | 卌 卌 \|\|\| | .................. |
| අත් පන්දු | ............................ | 12 |
| පා පන්දු | ............................ | 5 |
| රගර් | 卌 卌 卌 卌 | ............... |

b) ළමුන් කිහිපදෙනෙකු දිවා ආහාරයට කැමති දෑ පිළිබඳ වගුවේ දැක්වේ.

| ආහාරය | සිසුන් ගණන |
|---|---|
| මස් | o o |
| මාළු | o o o o |
| බිත්තර | .................. |
| එළවළු | o o |

i. මස් අනුභව කිරීමට කැමති සිසුන් ගණන 12 නම් o කීදෙනෙක් නිරූපණය වේද ?

i. මාළු අනුභව කිරීමට කැමති සිසුන් ගණන කීයද?

ii. මුළු සිසුන් ගණන 120 නම්, වගුවේ හිස් තැන් සම්පූර්ණ කරන්න.

---

08). a). i. හිස් තැනට සුදුසු වචනය වරහන තුළින් තෝරා ලියන්න.

❖ 6 ශ්‍රේණිය ළමුන්ගේ දෛනික පැමිණීම .......................... කි. ( නියතය , විචල්‍යය)

❖ වර්ෂයකට ඇති මාස ගණන .................. කි. ( නියතය , විචල්‍යය)

ii. මල්ලක ඇති අඹ වලින් ගෙඩි 05 ක් නරක් වී ඉවත් කරන ලදී. ඉතිරි අඹ ගෙඩි ප්‍රමාණය සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩ නගන්න.

b). i. දී ඇති සංඛ්‍යා අතරින් කොටුවලට ගැලපෙන සංඛ්‍යා තෝරා ලියන්න.

100, 12

8, 25

30, 55

2 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා

5 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා

10 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා

ii. ඇපල් ගෙඩි 40 ක් සමාන ඇපල් ගෙඩි ගණනක් තිබෙන සේ පාර්සල් කළ යුතුව ඇත. එලෙස සෑදිය හැකි පාර්සල් ගණන 5 නම් එක් පාර්සලයක ඇති ඇපල් ගෙඩි ගණන සොයන්න.

ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න